ඉඩම් මැනුම් සභාව

---------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ඉඩම් මැනුම් සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2010 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළයෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව සභාවේ සාමාජික දීමනා සහ විගණන කලමණාකරණ කමිටු රැස්වීම් දීමනා සඳහා වූ රු. 348,890 ක් වූ ගෙවීම් වෙනත් දීමනා යටතේ ගිණුම්ගත කරනු වෙනුවට වෙනත් සේවා ගෙවීම් වශයෙන් වර්ගීකරණය කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 09 ප්‍රකාරව මාස 3 ට අඩු කල්පිරීමේ දින සහිත ස්ථාවර තැන්පතු මුදල් හා මුදල් හා සමාන දෑ ලෙස වර්ගීකරණය කල යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී රු 500,000 වූ මාසික ස්ථාවර තැන්පතු වටිනාකම අත්හැර තිබුණි.

**1.2.2 අවිනිශ්චිත ගිණුම්**

----------------------

2010 දෙසැම්බර් 31 දිනට රු.5,850 ක අවිනිශ්චිත ගිණුමක ශේෂයක් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

**1.2.3 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

--------------------------------------------------

පහත සඳහන් නීති,රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (i) 2002 අංක 17 දරන මැනුම් පනත | |
| 46(1) වගන්තිය හා සහා තීරණ අංක 67.9 | සමාදාන විනිශ්චයකාරවරයෙකු විසින් අත්සන් කරන ලද නියමිත ආකෘති පත්‍රයක චෝදනා ඉදිරිපත් කළ යුතු වුවත් සමහර අවස්ථා වලදී ලිඛිතව ඉදිරිපත් නොවූ පැමිණිලි පිළිබඳවද සභාව විසින් කටයුතු කර තිබූ බැවින් ඒ සම්බන්ධව සභාව නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබූ බව නිරීක්ෂණය විය. |
| (ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී <u>ජනරජයේ ආයතන සංග්‍රහය</u> | |
| (අ) IIපරිච්ඡේදයේ 13.3 වගන්තිය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක ඩීඑම්එස්/ඊ/35/4/391 දරන 2009 ජනවාරි 06 දිනැති ලිපිය | 2009 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා ස්ථිර පදනමින් නිලධාරියෙකු බඳවා ගන්නා තෙක්, අදාළ තනතුර සඳහා සුදුසුකම් සපරා ඇති නිලධාරියෙකු වැඩබලන ලේකම්වරයෙකු ලෙස පත් කිරීමට අනුමැතිය ද තිබුණි. නමුත් 2010 දෙසැම්බර් 31 දින තෙක් එම පුරප්පාඩුව සම්පූර්ණ කර නොතිබුණි.ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා සභාව විසින් තවදුරටත් ඉදිරියේදී කටයුතු කරන බවත් සභාපතිවරයා දැනුම් දී ඇත. |
| (ආ) II පරිච්ඡේදයේ 10 වගන්තිය | සභාවේ නිලධාරීන් සඳහා පොදු 169 ආකෘති පත්‍රය සම්පූර්ණ කර වෛද්‍ය වාර්තා ලබාදී නොතිබුණි. |
| (ඇ) II පරිච්ඡේදය 10.10 උපවගන්තිය | සභාවේ සේවය කරන නිලධාරීන්ගේ අධ්‍යාපන සහතික වල පිටපත් සත්‍ය පිටපත් බවට අදාල ආයතන වෙතින් සහතික කර පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කර නොතිබුණි. |

(iii) චක්‍රලේඛ

----------

| | |
|---|---|
| (අ)2004 අගෝස්තු 10 දිනැති අංක පීඊඩී 25 (1) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන ඡේදය. | සභාවේ අතිරික්ත අරමුදල් රු.1,500,000 ක් 2010 දෙසැම්බර් මාසයේදී ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කර ඇතත් ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2007 මැයි 11 දිනැති අංක 09/2007/ 01 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | |
| (i) II වගන්තිය | විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවයේ යෙදවීමට පත් කිරීමේ බලධාරියා වෙත නිර්දේශ කළ යුතු වුවත් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් ලිපිකරු තනතුර සම්බන්ධයෙන් එසේ ක්‍රියා කර නොතිබුණි. |
| (ii) III වගන්තිය | විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවයේ යෙදවීම මාස 12 ක කාලපරිච්ඡේදයකට සීමා කල යුතු වුවත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ලිපිකරු තනතුරේ සේවයේ යෙදවීම වර්ෂ 3 ක් එනම් වයස අවුරුදු 62 දක්වාද අනුමත කර තිබුණි. |
| (iii) 2(vi) වගන්තිය | ද්විතියික ශ්‍රේණියේ තනතුරු සඳහා අදාල නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේ අවසන් වරට ලැබූ වැටුපෙන් 50% ක් හෝ රු. 10,000 යන දෙකින් වැඩි මුදල මාසික දීමනාව වශයෙන් ගෙවිය යුතු වුවත් ඉඩම් මැනුම් සභාව විසින් අදාල නිලධාරියා සඳහා රු. 20,000 ක මාසික දීමනාවක් අනුමත කර ගෙවීම් සිදු කර තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුල ඉඩම් මැනුම් සභාවේ වැඩ කටයුතු වල රු. 1,580,073 ක ඌනතාවයක් පෙන්නුම් කළ අතර ඉකුත් වර්ෂයෙ අතිරික්තය රු.1,680,422 ක් වූයෙන් රු.3,260,495 ක් ලෙස, 206.35% ක මූල්‍ය ප්‍රතිඵල වල අඩුවීමක් දක්නට ලැබුණි.2010 වර්ෂය වෙනුවෙන් ලද බලපත්‍ර ගාස්තු ආදායම 2009 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

2002 අංක 17 දරන මැනුම් පනතෙහි සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 37 (අ) වගන්තිය

ඉඩම් මැනීම් කටයුතුවල නියුතු තැනැත්තන් අතර වෘත්තීයමය විනය පවත්වාගෙන යාම මැනුම් පනත ප්‍රකාරව අරමුණු කරගෙන තිබූ අතර බලය නොලත් පුද්ගලයින් සකසන මැනුම් පිඹුරු හා මිනින්දෝරුවන්ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධ පැමිණිලි පිළිබඳව සමාලෝචිත වර්ෂයේ කටයුතු කර තිබූ ආකාරය පහත දැක්වේ.

| | |
|---|---|
| 2009 දෙසැම්බර් 31දිනට විසදා නොතිබුණු පැමිණිලි සංඛ්‍යාව | 41 |
| පැමිණිලි ලේඛණයට අනුව 2010 වර්ෂයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 55 |
| විසදිය යුතු පැමිණිලි සංඛ්‍යාව | 96 |
| 2010 වර්ෂය තුළ විසඳු පැමිණිලි සංඛ්‍යාව | 56 |
| 2010 දෙසැම්බර් 31 දිනට විසදුම් නොලැබූ පැමිණිලි සංඛ්‍යාව | 40 |

(ii) මැනුම් පනතේ 37 (ඊ) සහ (උ) වගන්ති අනුව මිනින්දෝරු වෘත්තීය හා සම්බන්ධ සුදුසුකම් ලැබීමේ විභාග පැවැත්වීම , අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණු වලදී සම තත්ත්වයන් ස්ථාපිත කිරීම සඳහා විදේශ රටවල බලධරයන් සමග එකඟතාවක් ඇතිකර ගැනීම වැනි කරුණු අරමුණු කර ගෙන තිබූ නමුත් ඒවා ඉටුකර ගැනීම සඳහා කිසිදු වැඩ පිළිවෙලක් හඳුන්වා දී නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. මැනුම් බලපත් ලබා ඇති නිලධාරීන් දෙපාර්තමේන්තු පුහුණුව හා පළපුරුද්ද ලබාගෙන ඇති බැවින් එවැනි අවශ්‍යතාවයක් නොමැති බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

## 2.3 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම අනව මිනින්දෝරුවන් 60 දෙනෙකු ලියාපදිංචි කරගැනීම ඉලක්ක කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී මිනින්දෝරුවන් 69 ක් ලියාපදිංචි කර තිබුණි. 2009 වර්ෂයේදී ඉලක්කය 170 ක් වූ අතර ලියාපදිංචි කරගෙන තිබූ මිනින්දෝරුවන් සංඛ්‍යාව 60 ක් විය.

(ii) සභාව සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී 2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව තිබිය යුතු අංග සමහරක් ඇතුළත් කර නොතිබුණි.

උදා:- පසුගිය වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

(iii) ඉලක්ක ඉටුකිරීමේ ප්‍රගතිය දැක්වීමේ අරමුණින් වර්ෂය අවසානයේ ක්‍රියාකාර සැලැස්ම සංශෝධනය කර තිබුණි.

## 2.4 මෙහෙයුම් හා කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2007 ජූලි 19 දිනැති අංක ආ/8/2/720/272/3 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය මගින් 2007 දෙසැම්බර් 31 දින දක්වා පමණක් උපකමිටු රැස්වීම් සඳහා දීමනා ගෙවීමට අනුමැතිය දී තිබුණු නමුත් විධිමත් අනුමැතියකින් තොරව 2008 ජනවාර් මාසයේ

සිට 2010 දෙසැම්බර් මාසය දක්වා උප කමිටු රැස්වීම් දීමනා සහ සාමාජකයන් තිදෙනෙකුට ප්‍රවාහන දීමනා වශයෙන් පිළිවෙලින් රු. 79,500 ක් සහ රු.110,288 ක් ගෙවා තිබුණි.

(ii) ලයාපදිංචි මිනින්දෝරුවන්ගේ නාම ලේඛණයක් සභාව විසින් පවත්වාගෙන ගියද එම ලේඛණය යාවත්කාලින නොකිරීම හේතුවෙන් දැනට වෘත්තියේ නියැලී මැනුම් කටයුතු වල යෙදෙන සහ නොයෙදෙන ලයාපදිංචි මිනින්දෝරුවන සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට හැකියාවක් නොතිබුණි.

**2.5 විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

2005 ජුලි 01 දිනැති අංක පීඊඩී 31 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාස 3 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් , 2010 වර්ෂය සඳහා සභාව විසින් අවස්ථා දෙකකදි පමණක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා තිබුණි.

**2.6 අයවැය පාලනය**

------------------

2010 වර්ෂයේ සභාව වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛනයේ හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය කාර්යක්ෂම කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**3. පද්ධති හා පාලන**

-------------------

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකරවා ඇති අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

i. පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම
ii. අභ්‍යන්තර විගණනය
iii. ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම
iv. ආයෝජන පොලී